**බළන්ගොඩ නගර සභාව**

**2026.01.06 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය** **- බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** **- 2026.01.06**

**වේලාව** **-පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ.ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2025-12-09 දිනැති මහා සභා වාර්තාව සහ 2025-12-30 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් 2025-12-09 දිනැති මහා සභා වාර්තාව 2025-12-30 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභා වාර්තාවල සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, එහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, 2025-12-09 දිනැති මහ සභාවේ සභා වාර්තාවේ යෝජනා අංක 07:01:21 ඉන්ධන බිල්පතෙහි වටිනාකම වෙනස් වූ බැවින් එය සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන ලෙස තීරණය වූ බවත්,නමුත් සභා වාර්තාවේ එය ඒකමතිකව සම්මත වූ බවට වාර්තා කර ඇති බවත්, ඒ අනුව එය සංශෝධනය විය යුතු බවත් සඳහන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා තමා පසුගිය 2025-12-09 මහ සභාවේදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා තේරී පත්වූ බවත් එය ගැටළුවක් බවට හැඟෙන බැවින් නම ඉවත් කර එය සංශෝධනය කරන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා 2025-12-09 දිනැති මහ සභා වාර්තාවේ පිටු අංක 15 යෝජනා අංක 07:01:05 යටතේ තමාගේ ප්‍රකාශයේ "එම ලේඛණගතවීම බැහැරකරන ලෙස ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කළයුතු බවත්" යන්න "එම ලේඛනගතවීම බැහැරකිරීමට සභාවේ එකඟතාවය ලබා දිය යුතු බවත්"ලෙස සංශෝධනය විය යුතු බවත්, 2025-12-30 දිනැති මහ සභාවේ පදික කඩ 185/01 සිට 185/19 දක්වා කඩ කාමර වල තක්සේරුව 2027.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය වූ බැවින් එය සංශෝධනය විය යුතු බවත් පවසන ලදී.

**ඒ අනුව 2025-12-09 දිනැති මහ සභාවේ සහ 2025-12-30 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා ඉහත සංශෝධනයන්ට යටත්ව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**02.** **ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අදදින සභාවේ නිවේදන නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03.** **සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්ත්වයක් හේතුවෙන් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය 2026-01-06 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත් යොමු කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**04.** **සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

- නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම පිළිබඳව සභාව,පළාත් තක්සේරු දෙපාර්තමේන්තුව හා වෙළඳ සංගමය එක්ව සාකච්ඡාවක් පැවැත්වීටත්,එසේ සාකච්ඡා කර තීරණයකට එළඹෙන තෙක් 2025 වර්ෂයේදී අයකල කුලියම ගෙවීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලීම් කරමින් බළන්ගොඩ මධ්‍යම බස් නැවතුම්පොළ වෙළඳ සංගමය යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පැවසුයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති තක්සේරුව ක්‍රියාත්මක කිරීමට සිදුවන බව මෙම කඩ හිමියන් වෙත දැන්වූ බවත්, මෙම ඉල්ලීම පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කිරීමට හැකි බවත්ය.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ නව තක්සේරුව මඟින් ඉදිරිපත් කර ඇති මුදල දැනට අයකිරීම සුදුසු බවත් ,එම ඉල්ලීම ගරු ආණ්ඩුකාරතුමිය වෙත යොමුකර අදාළ තීරණය පරිදි පසුව අඩුකිරීමක් වෙතොත් අඩුකිරීම සුදුසු බවත්ය.

- සභාවෙන් යොමු කරන ලද ලිපියකට අනුව, 2025.03.30 ,2025.04.20, 2025.06.15, 2025.09.06 සහ 2025.11.30 වන දිනයන්හි වෙළඳුන් නොපැමිණීම, පොහොය දිනය සහ රටේ පැවති අයහපත් කාලගුණ තත්වය යන හේතූන් මත සතිපොළෙහි වෙළඳුන් නොමැතිවීම හේතුවෙන් එකී දිනයන්හි ගාස්තු අඩුකර දෙන ලෙස දන්වමින් සතිපොළ ටෙන්ඩර්කරු වන පී.සුජීව කුමාර මහතා යොමු කර ඇති ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් සභාගත කරන ලදී.
  ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ මේ සම්බන්ධව යෝජනාවක් අංක 07:01:03 යටතේ ඉදිරිපත් කර ඇති බැවින් එහිදි සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවයි.

❖ දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් ජනතාව  වෙනුවෙන් සිදුකළ පරිත්‍යාග පිළිබඳව සභාපතිතුමාටත් කාර්යමණ්ඩලයටත් ස්තුතිය පළ කරමින් රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එල්.ආර්.කේ.වසන්ත පුෂ්පකුමාර මැතිතුමා යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

❖ බළන්ගොඩ නගරයේ බස්නැවතුම්පළට දුර බැහැරින් පැමිණෙන මඟී ජනතාවගේ විඩාව නිවා ගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් පහසුකම් සැලසීම සම්බන්ධව බස් නැවතුම්පොළ ගොඩනැගිල්ල ඉදිකිරීමේදී අවධානය යොමුකර නොමැති බවත්, මේ හේතුවෙන් වැඩිහිටි මඟී ජනතාව අපහසුතාවයට පත්වන බවත්, ඒ අනුව වැඩිහිටි,වයෝවෘද්ධ හා රෝගී, මඟී ජනතාවගේ පහසුව සඳහා වාඩි වී සිටීමට ආසන පහසුකම් සලසා දෙන මෙන්ද, දුර බැහැර ප්‍රදේශවලට බළන්ගොඩ නගරයේ සිට බස් රථ ධාවනය වීමේදී ගමන් වාර දෙකක් අතර විනාඩි 45ක් පැයක් පමණ කාල පරතරයක් පවතින බවත්, මෙම බස් නැවතුම්පොළ ගොඩනැගිල්ල දෙමහල් ගොඩනැගිල්ලක් වන බැවින් පහත මාලය මෙම පහසුකම් ස්ථාපනය කිරීම සඳහා භාවිතා කළ හැකි බවත් දන්වමින් වැලිපතයාය, කෝන්ගහමංකඩ, සඳකිරණ වැඩිහිටි සංවිධානයේ සභාපති,කේ.ඩී කුලරත්න මහතා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමුකර ඇති ලිපියට අනුව  ඉහත වැඩිහිටි සංවිධානයේ ඉල්ලීම ඉටු කිරීම සම්බන්ධයෙන් සලකා බලා අවශ්‍ය විසඳුම් ලබා ගැනීමට සුදුසු පරිදි කඩිනම් පියවර ගන්නා ලෙස දන්වමින් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් පැවසූයේ මේ සම්බන්ධව ගත යුතු පියවර සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡා කළ යුතු බවත්, ආසන සකස් කිරීමේදී බංකු, පුටු ආදියට වඩා යකඩ පට්ටම් වලින් සකස් කරන ආසන සකස් කිරීම වඩා ප්‍රායෝගික වනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙය ඉතා හොඳ අදහසක් බවත්, නමුත් එක් ප්‍රදේශයකට නොව සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි එම ආසන පැනවීමේ පහසුකම සිදුවිය යුතු බව පවසන ලදී. ගරු සභාපතිතුමා පැවසූයේ සෑම ප්‍රදේශයකම මඟී ජනතාව  ආවරණය වන පරිදි එම ආසන පහසුකම් සැලසීම කළ යුතු බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ඉදිරි සභා වාරයට විධිමත් පරිදි මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවයි.

❖ බළන්ගොඩ, බාන්ස් රත්වත්ත මාවත, පරණ තැපැල් කාර්යාල මාවතේ පදිංචිකරුවන් වෙත මාර්ගය දෙපස නවත්වා තබන වාහන හේතුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ දැඩි අපහසුතාවයට මුහුණ දීමට සිදුව ඇති බවත්, මෙම මාර්ගයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආයතන වෙත පැමිණෙන වාහන මාර්ගය දෙපස නවත්වා තැබීම මෙම ගැටළුවට හේතු වන බවත්, මේ

හේතුවෙන් බොහෝ අවස්ථාවල අනවශ්‍ය ගැටළු හා තර්ජනකාරී තත්වයන්ට මුහුණදීමට සිදුව ඇති බවත්, අදාළ ආයතන හිමිකරුවන් දැනුවත් කළද ස්ථිර විසඳුමක් මේ වන තෙක් ලැබී නොමැති බවත්, එබැවින් මෙම ගැටළුවට විසඳුමක් ලෙස "No Parking" පුවරු ස්ථාපනය කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අදාළ වියදම් දැරීමට තමන් එකඟ බව දන්වමින් අංක 52/10, බාන්ස් රත්වත්ත මාවත, බළන්ගොඩ පදිංචි සී.එස්.එෆ් උබේසේකර මහතා යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසුයේ මෙම ගැටළුව පවත්නා බවත්, එම ඉල්ලීම සලකා බලා පුවරු ස්ථාපනය කිරීමට අවසර ලබා දීම කළ යුතු බවත්ය.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ එම මහතා විශාල ව්‍යාපාරයක් සිදු කරන අයෙකු බවත්, එයට රථ වාහන ඇතුළු කිරීමේදි ගැටළු ඇතිවන බවත්, බොහෝ වේලාවට ත්‍රීවීල් රථ නතර කර තබන බවත්,ඉසුරු ට්‍රේඩ් සෙන්ටර් සහ රෝයල් සෙරමික් ආයතනයට එම ව්‍යාපාර සඳහා පැමිණෙන වාහන එම ව්‍යාපාර සඳහා තිබෙන රථ වාහන නැවතුම් ස්ථානය භාවිතා කරන ලෙස නියෝගයක් ලබා දීම කළ යුතු බවත්, සී.එස්.එෆ් උබේසේකර මහතා යොමු කර ඇති ඉල්ලීම පරිදි පුවරු ස්ථාපනය කිරීමට වැයවන මුදල දැරීමට සූදානම් බව පවසා ඇති බැවින් මේ සඳහා අවසර ලබා දිය යුතු බවයි.

- බළන්ගොඩ, කොටුගොඩැල්ල, කොටුව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා දී ප්‍රදේශවාසීන් වෙනුවෙන් දක්වන ලද කාරුණිකභාවය අගය කරන බවත්, නාගරික මන්ත්‍රී මාලක බණ්ඩාර මහතාගේ නිර්දේශය සඵල කිරීමට නායකත්වය සැපයූ ගරු සභාපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රීතුමන්ලාටත්, ගරු ලේකම්තුමිය, වැඩ අධිකාරීතුමා ඇතුළු සභා කාර්යමණ්ඩලයටද ස්තූතිය පුද කරන බව දන්වමින් ගාමිණී අනුර වීරසේකර මහතා යොමු කර ඇති ස්තූති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- නිවස අසළ සියඹලා ගසක් ඉවත් කිරීම සම්බන්ධව ස්තූතිය පුද කරන බවත්, සුළු දැනුම්දීමකින් පසු සභාපතිතුමා වහාම ක්‍රියාත්මක වී එම ස්ථානයට අධිකාරී මහතා, කාර්මික නිලධාරී මහතා, විදුලි කාර්මික මහතා ඇතුළු සේවක මහතුන් පැමිණ ගස කපා මාර්ගය ගමනාගමනයට සුදුසු පරිදි සකස් කළ බවත්, විශේෂයෙන් නාගරික මන්ත්‍රී විමලසිරි මඩුවන්වෙල මහතා පැමිණ එම කටයුතු වලට ධෛර්යයක් ලබා දෙන ලද බවත් පවසමින් අංක 19,කොටුගොඩැල්ල ,බළන්ගොඩ යන ලිපිනයේ පදිංචි ධනපාල වඩුමේස්ත්‍රීස් මහතා යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

❖ බළන්ගොඩ නගරයේ පිහිටි කාර්පාර්ක් කඩකාමරවල වහලය පැරණිවීම මත සහ අබලන් තත්වයට පත් වීම හේතුවෙන් වැසි දිනයන්හිදී කඩකාමර තුළට වතුර ගලාඒම හේතුවෙන් එකී කඩ කාමරවල සිය ව්‍යාපාරවල නිරත වන පිරිස දැඩි අපහසුතාවයකට ලක්ව ඇති බවත්, ඒ හේතුවෙන් එම පිරිසෙන් ඇතැම් කඩකාමර හිමියන් මේ වන විටත් එහි වහලය අලුත්වැඩියා කර ඇති අතර වහලය සකස්කර ගැනීමට නොහැකි වූ කඩකාමර කිහිපයක් මේ වන විටත් එකී අපහසුතාවයන්ගෙන් පීඩා විඳින බවත්, ඒ අනුව ඉදිරියට පැමිණෙන වැසි කාල සීමාවට ප්‍රථම එකී කඩකාමරවල වහලය අළුත්වැඩියා කිරීමට අවශ්‍යාව ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් දන්වමින් කාර්පාර්ක් කඩ හිමියන් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා මේ සඳහා බලය දෙන්නේ 2025.12.08 දින බවත්, නමුත් අදදින සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන බවත්, මේ පිළිබඳව සභාවේ කිසිඳු මන්ත්‍රීවරයෙකු දැනුවත් නොමැති බවත්, සභාවේ මන්ත්‍රීවරුන් ලෙස නිතර ගැවසෙන තැනක මෙවැනි දෙයක් කිරීමේදී දැනුවත් නොකිරීමේදී සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට තිබෙන ගරුත්වය පිළිබඳ ගැටළුවක් මතුවන බවත්, ගරු සභාපතිතුමා තනි තීරණයක් ගෙන මෙය සිදු කළානම් ඒ පිළිබඳ කණගාටු වන බවත්, එහිදී සභාවේ පවත්නා සහසම්බන්ධතාවය පවත්වාගෙන යන්නේ කෙසේද යන්නත්, එපමණක් නොව මෙහිදී කඩ කාමර පුළුල් වීමක් සිදුවන බැවින් සභාපතිතුමා මෙයින් යම් අල්ලසක් ගත්තාද යන්න පිළිබඳව සැකයක් පවතින බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින්, මෙම කාරණාව ඉතා සංකීර්ණ කාරණාවක් බවත්, පළාත් පාලන ආයතනයක දේශපාලන අධිකාරය ලෙස සභාපතිවරයාට තනිව තීරණය කළ හැකි කාරණා පවතින බවත්, අනතුරුදායක ගසක් ඉවත් කිරීම වැනි කාරණා එලෙස ඉටු කළ හැකි බවත්,මෙම  කඩ කාමර ලබා දී ඇති ගිවිසුම අනුව එකී කඩ කාමරවල යම් ඉදිකිරීමක් කිරීමේදී සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගිවිසුමේ වගන්තියක් පවතින බවත්,ඉහත ආකාරයේ නිර්මිතය වෙනස් කිරීමකදී සභාව ඒ සඳහා අනුමැතිය ලබා දිය යුතු බවත්, සභාවේ අනුමැතියෙන් පසු සභාව නියෝජනය කරනු ලබන ක්‍රියාකාරී සාමාජිකයෙකුට එය පැවරිය හැකි බවත්, කුමන හේතුවක් නිසා ගරු සභාපතිතුමා ඉහත තීරණය ගත්තාද යන්න නොදන්නා බවත්ය.

අදිදින න්‍යාය පත්‍රයට කල් දී ප්‍රශ්න යටතේ මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඉදිරිපත් කර ඇති බව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ මෙම අවස්ථාවේදීම ඒ සඳහා පිළිතුර මෙම අවස්ථාවෙදීම සාකච්ඡා කර අවසන් කළ යුතු බවයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ ඉහත කඩ කාමර සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ගෙන ඇති තීරණයට ගරු සභාවේ මතය විමසන ලෙසයි.ගරු සභාපතිතුමා මේ පිළිබඳ කරුණු පැහැදිලි කිරීමට යාමේදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ මෙය ඉතාම හොඳ වැඩක් බවත්, ගරු කළ යුතු වැඩක් බවත්, නමුත් ගරු සභාව අපහසුතාවයට පත්වීමට නොදී , ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබාගෙන කලානම් එය ඉතා වැදගත් බවත්,එබැවින් තමන් මේ පිළිබඳව සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ මතය විමසීමට යෝජනා කළ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසුයේ ආනන්ද සභාපතිතුමාගේ කාලයේදී මේ සම්බන්ධව සැලැස්මක් සකස් කළ බවත්, එහි උඩු මහළ නීතිඥවරුන් වෙත ලබා දීමටත්, දෙපැත්තේ කඩවල සිටින කඩ හිමියන්ට උඩු මහළ ලබාදී එම ස්ථානයෙන් උසාවියට මාර්ගයක් සකස් කිරීමටත්,ආදී ලෙස එම සැලැස්ම සකස් කළ බවත්, කාර්පාර්ක් එක බළන්ගොඩට පවත්නා ලොකු සම්පතක් බවත්, බළන්ගොඩ නගරය ලස්සන කළ යුතු බවත්, නමුත් දැන් එම ස්ථානයේ කඩ හිමියන් කැමති ලෙස එක් වහලක් උස්ව තවත් එකක් වෙන උසකින් ලෙස ඉතාම අශෝභන ලෙස ඉදිකරමින් පවතින බවත්, එබැවින් මෙය මන්ත්‍රීවරුන්ද දැනුවත් කර සැලැස්මක් සහිතව විධිමත් ඉදිකිරීමක් ලෙස ස්ලැබ් එකක් දමා හෝ ඉදිකිරීම සුදුසු බවත්, කලින්නම් මෙම ස්ථානයේ කඩ කාමර ඉදිකරන තෙක් නාගරික සංවර්ධන අධිකාරී ඉඩමේ තාවකාලිකව කඩ ඉදිකර ලබාදීමට සැලසුම් කර තිබූ බවත්, එය අනුමත වූවාද යන්න නොදන්නා බවත්, නගර සභාවේ මන්ත්‍රීවරුන් ලෙස එම ස්ථානයට යාමේදී ජනතාව විමසීමේදී අපහසුතාවයට පත් වන බවත්, එබැවින් සභා අනුමැතියට යොමුකර මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගෙන කරනවානම් එය වටිනා බවත්ය.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ මෙහි නැවත ඉදිකිරීම් කිරීමේ ගැටළු කිහිපයක් පවතින බවයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ එහි සැලසුම සඳහා අවසර නොදුන්නේ අධිකරණය ආසන්න බැවින් ආරක්ෂාව පිළිබඳ හේතුවෙන් බවත්, සැලසුමට අනුව සකස් කිරීමේදී උසාවියට ගමන් කළ හැකි බැවින් එලෙස ගමන් කළ හැකිවීම අධිකරණයේ ආරක්ෂාවට බලපාන බැවින් එම ස්ථානයෙන් අධිකරණය වෙත ගමන් කිරීමට තිබූ මාර්ගයද මේ වන විට වසා දමා ඇති බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙම කඩ හිමියන් ලෙස වැඩිපුරම සිටින්නේ නීතිඥ මහත්වරුන් බවත්, වහලයෙන් වතුර වැටෙන බවත්, එතුමන්ලාගේ ලියවිලි ආදිය තෙමෙන බවත් සේවා ලාභීන්ට අවහිරවන බවත් දන්වමින් පැමිණිලි කළ බවත්, එම ස්ථානයේ කාර්මික නිලධාරී මහතුන් යවා නිරීක්ෂණය කළ බවත්, එතුමන්ලාගේ අධීක්ෂණය යටතේ කඩ කිහිපයක වහල කීපයක් ඉදිකිරීමට අවසර ලබා දුන් බවත්, සභාපති ලෙස සත්භාවයෙන් සිදුකල කාර්යයක්

බවත්, උසාවියට යන මාර්ගයේ යන විට මෙම වහලවල් වල ඉටිරෙදි පවා යොදා තිබූ බැවින් ඉතාම අවලස්සන ආකාරයට පැවති බවත්, සීබිලිස් මහතාද එම කඩ කාමරය තෙමෙන බවට පැමිණිලි කල බවත්, නමුත් එම මහතා වහලවල් ඉදිකිරීමට ඉල්ලීම් නොකළ බවත්, එම අවස්ථාවේ එම තෙමෙන තැන් අළුත්වැඩියා කිරීමට සභාවේ සේවක මහතෙකු යෙදවූ බවත්, අනිකුත් කඩ කාමරවල කඩ හිමියන් වහලය අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය දැඩි සේ තිබූ බවත්,වැයවන වියදම දැරීමට එකඟ වූ බැවින් තමන්ද එම ස්ථානය නිරීක්ෂණය කළ බවත්, එහිදී එය අළුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින බවටත් එය කළ යුතු බවටත් නිරීක්ෂණය වූ බවත්,සභාවට දැනුම් දීමට නොහැකිවීම ප්‍රමාදදෝෂයක් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා අඩුව තිබියදී අත පුච්චගත්තා වගේ වැඩක් සිදු වී ඇති බවත්, එය සිදු කිරීමට තිබූ ක්‍රමවේදයෙන් පරිබාහිරව සභාපතිතුමාගේ අභිමතය පරිදි සිදු කළ හැකි දෙයක් ලෙස කර ඇති බවත්, නමුත් මෙහි ගැටළුවක් පවත්නා බවත්, මෙම කාර් පාර්ක් සංගමයේ ඉල්ලීම යොමු කර ඇත්තේ 2025.12.05 වන දින බවත්, නමුත් පසුගිය මහ සභාව පැවතියේ 2025.12.09 දින බැවින් එම ලිපිය සභාවට ඉදිරිපත් කිරීමට සභාපතිතුමාට හැකියාව තිබූ බවත්, යම් කිසි වෙනත් ක්‍රියාදාමයක් යටින් සිදුවනවා යන්න ලිපිය ඉදිරිපත් කළ දිනය සහ සභාපතිතුමා ඊට අනුමැතිය ලබා දුන් දිනය හා සැලකීමේදි තේරුම් යන බවත්, නමුත් ගරු සභාපතිතුමා එය සත්භාවයෙන් සිදුකළා යන්න සඳහන් වෙලා තිබේනම් ඉදිරියේදී ගරු සභාපතිතුමාගේ නිවරදිතාවයට එය ගැටළුවක් නොවනු ඇති බවත්, මෙම තීරණය ගැනීමට සභාපතිතුමා හදිසි වූ බවක් පෙනී යන බවත්, ඉදිරියට එම කඩ හිමියන් දැනුවත් කර විධිමත් ආකාරයට එය සිදු කිරීම සුදුසු බවත්, ඉදිරි සභාවක් වෙත හෝ යොමුකර වැරද්ද නිවරදි කිරීමට යොජනා කරන බවත්ය.

මෙම කාර් පාර්ක් කඩ හිමියන්ගේ කී මනි තැන්පතුවක්වත් සභාවේ නොමැති බවත්, එම කඩ හිමියන්ගේ වියදමින් ඉදිකිරීම් කිරීමට අවසර ලබා දී ඇති බැවින් ඉදිරියේදී එම කඩ හිමියන්ගේ වියදමින් ඉදිකිරීම් කළ බවට තර්ක මතුකළ හැකි බවත්, ගැටළු ඇතිවිය හැකි බවත්, ගරු සභාපතිතුමාගේ චරිතය පිළිබඳ තමන් පෞද්ගලිකව දන්නා බැවින් වංචනිකව මේ සඳහා සම්බන්ධ වූ බවට කිසිඳු අවස්ථාවක තමන් නොකියන බවත්, නමුත් වැරදි උපදේශයක් හෝ කුමක් හෝ හේතුවක් මත වැරදි තීරණයක් ගෙන ඇති බවත්, ඇත්තටම මෙය සැහැල්ලුවෙන් බැහැර කළ නොහැකි ඉතා සංකීර්ණ කාරණාවක් බවත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් ලැබුණු ආරංචි මාර්ග අනුව එක් කඩ හිමියෙක් මේ සඳහා රුපියල් ලක්ෂයක මුදලක් දෙන බවත්, මෙම ලිපිය

2025.12.07 දිනම සභාපතිතුමාට ලැබුනද යන්න පිළිබඳව ගැටළුවක් පවතින බවත්, ඒ සඳහා නිර්දේශයක් ලබා දී ඇත්ද යන්න පිළිබඳව පැහැදිලි කර දෙන ලෙසත් පවසන ලදී.

ඒ අනුව කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.
කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත කාරණාව සම්බන්ධයෙන් සභාවේ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම් ඉදිරිපත් කළ බවත්, බෙදීමකට යා යුතු කාරණාවක් නොවන බවත්ය. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ ගරු සභාපතිතුමා සත්භාවයෙන් සිදු කළද, ජනතාවට සේවය කිරිමට පැමිණ අනවශ්‍ය කරදරවලට පැටලිය නොහැකි බැවින් මේ සඳහා බෙදීමක් ඉල්ලුම් කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉහත බෙදීම ඉල්ලීම් කලේ එම ලිපියටද එසේ නොමැතිනම් ක්‍රියාකලාපයටද යන්න ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විමසන ලදී. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ කඩ කාමරවල කරනු ලබන ඉදිකිරීම සාධාරණ බවත්, මන්ත්‍රීවරුන් නොදැනුවත්ව ඒකමතිකව එම තීරණය ගැනීම පිළිබඳව මතය විමසන බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ කියන ආකාරයට සියළුම කඩ කාමරවල වහලය සකස් කිරීමක් සිදු වී නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් තමන් සභාපතිධූරය දරන කාලයේද එවැනි සිදුවීමක් සිදුවූ බවත්, එහිදී තානායම අසල ගොඩනැගිලි දෙකකට සැලසුම් සභාවට දමා අනුමැතිය ලබා ගත් බවත්, අන්තිමට වැරදිකාරයා ලෙස තමාට කෝපා කමිටුව වෙත යාමට සිදුවූ බවත්, සියල්ලෝම නොවුවද ඇතැම් නිලධාරීන්ගේ කූට වැඩ තිබෙන බවත්, එවැනි දෙයෙක් තමාට සිදුවූ බවත්, 14වැනිදා සභාවේ තීරණය ගෙන 15 වැනිදා අනුමැතිය දුන් බවත්, එම අවස්ථාවේ කර්මාන්ත අංශයේ සිටි ප්‍රධානියා ඒ සඳහා අනුමැතිය දෙන්නේ නෑ වගේ ඉඳලා කරන්න දෙයක් නැති කමට සභාවේ අනුමැතිය ලබා ගත් පසු පෙර දිනයකින් තමාගෙන් ලිපි අත්සන් කරගෙන ඇති බවත්, එවිට තමා වැරදිකාරයා වූ බවත්, සභාපතිතුමාද ලිපිය අත්සන් කිරීමේදී පරීක්ෂා කර අත්සන් කලේද යන්න පිළිබඳව තමන් විමසූ බවත්, මෙහි නොසිතන දේවල් සිදුවන බවත්, සභාපතිතුමාගේ බේරුමට එතුමා අවශ්‍යවන දෙයක් සිදු කරන ලෙසත්, නමුත් මෙහිදී විරුද්ධ වෙනවා යැයි පැවසුවද සභාපතිතුමා වැරදිකාරයා කිරීමට අවශ්‍යතාවයක් නොවන බවත්, මෙහි එම කඩ හිමියන් වසර ගණනාවක් තිස්සේ සභාව වෙත ආදායම් ලබා දෙන බවත්, මෙය සිදු කිරීමට තිබූ ක්‍රමවේදයට

පරිබාහිරව භාවිතා කළ ක්‍රමවේදයේ වෙනසක් පවතින බවත්, ක්ෂණික තීරණයක් ගෙන ඇති බවත්, එම තීරණයේ වැරද්දක් පමණක් තිබෙන බවත්, එසේ නොමැතිව හොරකමක් වංචාවක් මෙහි සිදුවී නොමැති බවත්, හිතනවට වඩා සංකීර්ණ ගැටළුවක් බවත්, එහිදී අන්තිමට බේරගන්න කිසිවකු නොමැති බවත්, දැන් තමා සභාවේ අනුමැතියද රැගෙන සිදුකළ දෙයින් වැරදිකාරයා බවට පත්වී ඇති බවත් සඳහන් කරමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

- ඕලුගංතොට කරදියමුල්ල සුසානභූමියේ සුසානභූමි භාරකරු වශයෙන් 2008 වර්ෂයේ සිට සේවයේ යෙදී සිටින බවත්, දැනට ඒ සඳහා වැටුප රු.15,000ක දීමනාවක් ලබා දෙන බවත්, වසර 05ක සිට මෙම දීමනාව වැඩි කිරීමක් සිදුකර නොමැති බවත්,එම මුදලින් තමාට ජීවත් විය නොහැකි බවත්, සුසාන භූමියේ තණකොළ කැපීමේ යන්ත්‍රයට ඉන්ධන සඳහා වැයකරන්නේද මෙම මුදලින් බවත්, ඒ අනුව වැටුප වැඩිකිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිටිමින් ඩබ්.එල් චන්ද්‍රසිරි තිලකරත්න මහතා යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම සුසානභූමි භාරකරු ඉතා කැපවීමෙන් වැඩ කරන බවත්, ඔහු බඳවාගැනීමට කලින් මෙම සුසානභූමිය වල්වැදී තිබූ බවත්, නමුත් දැන් එය විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යන බවත්, ඔහුගේ දීමනාව රු.5000කින් වැඩි කිරීමට යෝජනා කරන බවත්ය. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා දැනට පවත්නා ආර්ථික තත්වය අනුව එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ ඉහත සුසානභූමි භාරකරුට පමණක් නොව සමස්ථයක් ලෙස බෝම්බුව සහ බුලත්ගම යන සුසානභූමිවල භාරකරුවන්ගේ දීමනාද වැඩි කළ යුතු බවයි.තණකොළ කැපීම සඳහා ඉන්ධන වියදම වෙනම ලබාදී සුසානභූමි භාරකරුවන්ගේ දීමනාව රු.5000කින් වැඩිකිරීමට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ මන්ත්‍රීවරුන් සිව් දෙනෙකු නියෝජනය කරන, බළන්ගොඩ නගරයේ ප්‍රධාන සුසානභූමිය වන බුලත්ගම සුසානභූමියේ කිසිඳු භාරකරුවෙකු නොමැති බවද, බොහෝ ප්‍රදේශවල පොදු සුසාන කටයුතු සිදුවන්නේ එම සුසානභූමියේ බවද, අනිකුත් සුසානභූමි උද්‍යාන ලෙස ලස්සනට පවත්වාගෙන ගියද ඒවාට එතරම් පිරිසක් නොසිටින බවද, නමුත් ප්‍රධාන සුසානභූමිය ලෙස බුලත්ගම සුසානභූමියේ විදුලිය,ජලය තියා ගේට්ටුවක්වත් නොමැති බවද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසීය.

ගරු සභාපතිතුමා මෙහිදී එම සුසානභූමියේ පිහිටා ඇති ස්ථානය අනුව ගේට්ටු කඩන බවත්, වතුර බට කඩා දමන බවත්, විදුලි බල්බ ගලවන් යන බවත් ඒ අනුව මෙහි සියළුම අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා මුදලක් වෙන්කර විධිමත් පරිදි සුසානභූමි භාරකරුවෙකු යොදවා එම කටයුතු සිදු කරන බවත් පැවසීය.

- හදිසි ආපදා තත්වය හේතුවෙන් ඇතිවිය හැකි ජීවිත අනතුරු පිළිබඳ පූර්ව දැනුම්දීමක් සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLG 06/02/01 දරණ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

එම ලිපිය අනුව අංක 23/6, දෙවන පටුමඟ, මුගුණමලය,බළන්ගොඩ ලිපිනයේ පදිංචි ඊ.ඒ.එම් හර්ෂණ ප්‍රියන්ත මහතා විසින් 2025.11.24 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව යොමුකර ඇති බවත්, එකී ලිපියට අනුව ඔහුගේ ඉඩමට ඉහලින් ඉත්තෑගල ගමට ප්‍රවේශවන මාර්ගය පිහිටා ඇති බවත්, එම මාර්ගයේ ජලය බැසයාම සඳහා නිසි පරිදි කාණු පද්ධතියක් නොමැති වීම හේතුවෙන් මාර්ගයේ ජලය තමාගේ හා අවට ඉඩම්වලට ගලා ඒම හේතුවෙන් නිවසට ඉහලින් පිහිටි ප්‍රදේශයේ නායයෑමේ දැඩි අවධානම් තත්වයක් නිර්මාණය වී ඇති බවත්, මීට වසරකට පෙර ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මේ පිළිබඳ දැනුවත් අවශ්‍ය නිර්දේශ බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ආපදා කළමණාකරණ කොට්ඨාශයට සහ නගර සභාව වෙත ඉදිරිපත් කළද ඒ සම්බන්ධව මෙතෙක් කටයුතු කර නොමැති බවත්, එබැවින් අදාළ ආයතන දැනුවත් කර මිනිස් ජීවිතවල සුරක්ෂිතභාවය තහවුරු කර දෙන ලෙසත් ඉල්ලීම් කර ඇති බවත් දන්වා ඇත.

තවද ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇති භූ අස්තාවරතා අවදානම පිළිබඳ මූලික සමීක්ෂණ වාර්තාවට අනුව අවදානම අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වා දී ඇති බවත්, උක්ත වාර්තාවට අනුව මෙය විශේෂිත ආපදා තත්වයක් හා මධ්‍ය අවදානම් සහගත තත්වයේ පවතින බවට පෙන්වා දී ඇති බැවින්ද, මෙහි කාණු පද්ධති ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී වුවද අනතුරුදායක තත්වයන් ඇතිවිය හැකි බැවින් ආපදා කළමණාකරණ කටයුතු සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සම්බන්ධ වෙමින්, මෙම අනතුරුදායක තත්වය පරීක්ෂා කර බලා ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අදාළ නිර්දේශ අනුව පොදු කාණු පද්ධතිය ඉදිකිරීම තුළින් ඉදිරියේදි විය හැකි ආපදා වළක්වා ගැනීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වා ඇති බවත් ගරු සභාපතිතුමා දන්වන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ පසුගිය දිනවල භූ විද්‍යා ආයතනයෙන්ද පැමිණ ඉහත ස්ථානය පරීක්ෂණ සිදුකළ බවත්, එම ස්ථානයේ පදිංචි කීප දෙනෙකුද ස්ථානවලින් ඉවත් කිරීම් සිදු කළද අවදානම තවමත් තිබෙන බවත්, මේ සම්බන්ධව සොයාබලා කටයුතු කිරීමට සෑම කෙනෙකුගේම වගකීමක් තිබෙන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ඉහත අනාරක්ෂිත පදිංචිකරුවන් සිප්යානා ආයතනයේ නවත්වා තිබූ බවත්, එම ස්ථානයේ ජලය බැසයාම ගල්දමා අවහිර කර තිබූ ස්ථානය ගරු සභාපතිතුමාම මැදිහත්වී ඉවත් කළ බවත්, ජලය බැසයාම සිප්යානා ආයතනය අසළින් අවහිර කරන බවත්, ඉහත ලිපිය ඉදිරිපත් කර ඇති මහතා පවසන දෙය ඇත්ත බවත්, වැඩ අධිකාරී මහතාට මෙය පරීක්ෂා කරන ලෙස පැවසූ බවත්, කඩිනම් අවදානය යොමුකර මේ සඳහා පියවර ගත යුතු බවත්ය.

ගරු සභාපතිතුමා, මෙම ස්ථානය නිරීක්ෂණය කළ බවත්, වැඩ අධිකාරි මහතාට මෙම ස්ථානය පරීක්ෂා කර අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබා දීමත් සිදු කරන ලදී.

- මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉල්ලීම් පිරිස පරගහකුඹුර පාර සංවර්ධනය කිරීම සම්බන්ධව ස්තුතිය පුද කරන බවත්, එසේම පසුගිය සභා වාරයේදී තමන් ඉදිරිපත් කළ යෝජනාවක් වන ජයන්ති කඩේ ළඟ බෝක්කුව පිළිසකර කිරීමේ යෝජනාව සභාවේ සම්මත වූ බවත්, මෙය සභාවෙන් සිදු නොකරන්නේ නම් ජනතාව පුද්ගලික මුදලින් සිදු කිරීමට සැරසෙන බවත්, එබැවින් කඩිනමින් මෙම යේජනාව ක්‍රියාත්මක කර දෙන ලෙසත් පවසන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පැවසූයේ සංසරක්ඛිත ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් තිබෙන බවත්, එම මාර්ගය පළාත් සභාවට අයත් මාර්ගයක් වුවද නායක ස්වාමීන් වහන්සේගේ තුන්මස් පිංකම පැවැත්වෙන බැවින් එම මාර්ගය ප්‍රිමික්ස් යොදා වළවල් පිළිසකර කරදෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්, නමුත් ඒ වෙනුවෙන් ගැටළුවක් බවට පත්ව ඇත්තේ අයහපත් කාලගුණ තත්වය සහ ගල්රෝල මෙම දිනයන්හි සභාවේ නොමැති වීම බවත්ය. ඒ අනුව පළාත් සභා මාර්ගයක් වුවද හැකි කඩිනමින් එම මාර්ගය පිළිසකර කිරීමට වැඩ අධිකාරී මහතාට උපදෙස් ලබා දීම සිදු කරන ලදී.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

අදදින ටෙන්ඩර්පත් නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**06. කල් දී ඇති ප්‍රශ්න**

**06:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**06:01:01** බැංකියවත්ත කොම්පෝස්ට් අංගනය සඳහා වෙන්වූ මිලියන 40ක ප්‍රතිපාදන සම්බන්ධව ප්‍රගතිය කුමක්ද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ බැංකියවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයට හලර් යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් මිලියන 04ක ප්‍රතිපාදන වෙන්වූ බවත්, ඒ අනුව ඩෙක්මා ආයතනයේ ඉංජිනේරු මහතා විසින් කරන ලද ස්ථානීය පරීක්ෂණය අනුව ලබා දෙන ලද වාර්තාව පරිදි මිලියන 04ක ප්‍රමාණයකින් යුතු

හලර් යන්ත්‍රයක් ප්‍රමාණවත් නොවන බව දන්වා ඇති බවත්, ඊට වඩා විශාල ප්‍රමාණයකින් යුත් හලර් යන්ත්‍රයක් මිලියන 08ක් පමණ වන බව දන්වා ඇති බවත්, ඒ අනුව එම ප්‍රතිපාදන ඉල්ලීම් කරමින් රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශය වෙත යොමු කළ බවත්, ගරු උප සභාපතිතුමා මෙම කටයුතු වෙනුවෙන් සහභාගී වූ බැවින් මේ පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කරන ලෙස සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා සඳහන් කලේ තමන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා ඒ සඳහා සහභාගි වූ බවත්, ඩෙක්මා ආයතනයෙන් ලබා දුන් පිරිවිතර අනුව මිලියන 04ක මුදල ප්‍රමාණවත් නොවන බව ඉංජිනේරු මහතා පැවසූ බවත්, ඒ අනුව විස්තරාත්මක පිරිවිතර සහිත ඇස්තමේන්තුවක් ලබා ලෙස දැනුම් දුන් බවත්, ඒ අනුව එම වාර්තාව යොමු කළ බවත්ය.

**06:02 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**06:02:01** කාර් පාර්ක් කඩ කාමර අළුත්වැඩියා කිරීම සම්බන්ධව මන්ත්‍රීවරුන්ට දැනුවත් කිරීමෙන් පසුවද එය සිදුවන්නේ?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ කාර් පාර්ක් කඩ කාමර අළුත්වැඩියා කිරීම සම්බන්ධව සම්පූර්ණ තොරතුරු සංදේශ/පැමිණිලි/පෙත්සම් යටතේ සාකච්ඡා කළ බවයි.

**06:02:02** ලංකාවේ මෑතකදී සිදුවූ විශාල ආපදා පිළිබඳව සභාවේ මන්ත්‍රීවරුන්ට දැනුවත් කර, සභාවෙන් කුමන කාර්යයක් ඉටුකළාද?මේ සම්බන්ධයෙන් සභාවෙන් විවාදයක් ලබා දෙනවාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා, එම ආපදා අවස්ථාවේ සභාව වශයෙන් විශාල වැඩ කොටසක් සිදු කළ බවත්, විශේෂයෙන්ම නදීක මන්ත්‍රීතුමා සහ සිසිල මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙක් බදුල්ල ප්‍රදේශයට ගොස් ක්‍රියාකාරීව එම කටයුතු සඳහා සහයෝගය ලබා දුන් බවත්,සභාව ලෙස වාහන, සේවකයන් ලබාදීම වැනි අවශ්‍ය උපකාර සිදුකළ බවත්, විමලසිරි මන්ත්‍රීතුමාද එහි ගොස් එම ජනතාවට උපකාර කළ බවත්ය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසූයේ, ලංකාවේ ඉතිහාසයේ සිදුවූ විශාලම ආපදාවක් බවත්, අනෙකුත් සභාවන් වලින් මැදිහත්වී ඒ වෙනුවෙන් වැඩ කටයුතු සිදු කළ නමුත් සභාවක් ලෙස සංවිධානය වී දෙයක් සිදු නොකළ බවත්, විශේෂ මහ සභාවක් හෝ කැඳවා පක්ෂ බේදයකින් තොරව සභාවක් ලෙස එකතුවී කුමක් හෝ සිදුකළයුතුව තිබූ බවත්, සුනාමි ව්‍යසනය සිදුවූ අවස්ථාවේදීත් සභාව මැදිහත්වී මීට වඩා දෙයක් සිදුකළ බවත්, එක් කණ්ඩායමක් පමණක් සහභාගී වී එම කාර්යයන් සිදු

කිරීමෙන් ඵලක් නොමැති බවත්,එම කාර්යයන් සිදු කිරීමේදී මන්ත්‍රීවරුන් දැනුවත් නොවූ බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මුදල් වියදම් කිරීමේ හැකියාවක් පවතී නම් සිදුකිරීමට තවමත් වැඩ පවත්නා බවයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා පැවසුයේ මලික්ෂා මැතිතුමා පැවසූ දෙය සාධාරණ බවත්, මෙවැනි විශාල ආපදාවකදී නගර සභාවේ මන්ත්‍රී මණ්ඩලය ලෙස දෙයක් සිදු කළ යුතුව පැවති බවත්, ආයතනයක් වශයෙන් සියළුම මන්ත්‍රීවරුන් කැඳවා විශේෂ මහ සභාවක් හෝ කැඳවා සාකච්ඡාවක් සිදුකළ යුතුව පැවති බවත්, තනි තනි පුද්ගලයන් වශයෙන් නොව සභාවක් ලෙස මැදිහත්වී යමක් කිරීමට තිබූ බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එන්.ජ්.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභා වාරයට කලින් සභා වාරයේ සභාව ලෙස ආපදාවට ලක්වූ ජනතාව වෙනුවෙන් සභාවේ මන්ත්‍රී මණ්ඩලය සහ කාර්යමණ්ඩලය සම්බන්ධ වී ශ්‍රම මෙහෙයුමක් දියත් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, එම අවස්ථාවේදී මලික්ෂා මන්ත්‍රීතුමාට එයට මැදිහත්වී වැඩ කටයුතු සිදු කිරීමට සම්බන්ධ වීමට අවස්ථාව තිබූ බවත්, එම අවස්ථාවේ තමන් සභාවේ නිලධාරීන්ට සහ සම්බන්ධවූ සියළු දෙනාට ස්තුතිය පුද කරන අවස්ථාවේදීත් එයට සම්බන්ධ වීමට කතා කිරීමට හැකියාව තිබූ බවත්ය.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති කේ.ජී.පේමදාස මැතිතුමා**

**07:01:01 කාරක සභා පත්කිරීම**

**07:01:01:01 මුදල් කාරක සභාව පත්කිරීම හා බලතල පැවරීම.**

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු 159 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල අතරින් මෙහි පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම ආඥා පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්නත් එසේම එකී මුදල් කාරක සභාව සඳහා,

01.ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා

02.ගරු නාගරික මන්ත්‍රී එන්.ජ්.එස් චන්දන මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

06. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා

07. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා

08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා යන සභිකයන් පත් කිරීමටත්

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 39 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව සභාව විසින් හෝ මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයන් සමඟ ඇතිකර ගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම් වන විට හා ගිවිසුම්ගත ඇස්තමේන්තු වටිනාකම රුපියල් දසදහසට (රු.10,000.00) වැඩි වූත් රුපියල් ලක්ෂ දහය (රු.1,000,000.00) නොඉක්මවන පරිදිත් වන මූල්‍ය වටිනාකමක් වෙනුවෙන් ගිවිසුම්ගත වීම සඳහා බලය දීම හා ඊට අදාළ ගිවිසුම් අනුමත කිරීම සඳහා වන බලතල ඉහත කී පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පැවරීමටත් යෝජනා කරමි.

**ඉහත කී උපලේඛනය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදමක් වන විටදී රුපියල් දස දහසේ සිට (රු.10,000.00) සිට රුපියල් ලක්ෂ දහය (රු. 1,000,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් දස දහසේ (රු.10,000.00) සිට රුපියල් ලක්ෂ දහය (රු.1,000,000.00) දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, කර්මාන්ත කාරක සභාව, පුස්තකාල හා උපදේශන කාරක සභාව , පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව , සංවර්ධන උපදේශන කාරක සභාව යන කාරක සභා වලින් නිර්දේශ කරනු ලබන රුපියල් දස දහසේ (රු.10,000.00) සිට රුපියල් ලක්ෂ දහය (රු.1,000,000.00) දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 10,000.00 සිට රු. 1,000,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම, අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම, නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතීන් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම වේ.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ව්‍යාපාර කටයුතු සිදු කරන බැවින් සහ වාහන සම්බන්ධව හසළ දැනුමක් පවතින බැවින් ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය මුදල් කාරක සභාවේ සාමාජිකත්වය සඳහා යෝජනා

කරන බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ එවිට මුදල් කාරක සභාවේ සාමාජිකයන් 09 දෙනෙකු බැවින් ඔත්තේ අගයක් ගන්නා බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා එතුමා මුදල් කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට යෝජනා කළද ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා සඳහන් කලේ මුදල් කාරක සභාවේ සාමාජිකත්වයන් සෑම පක්ෂයක්ම නියෝජනය වන පරිදි පැවතිය යුතු බැවින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාගේ සාමාජිකත්වය වෙනස් නොකර තමන් එකී කාරක සභාවෙන් ඉල්ලා අස්වීමට යෝජනා කරන බවයි.

ඒ අනුව 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු 159 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල අතරින් මෙහි පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම ආඥා පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්නත් එසේම එකී මුදල් කාරක සභාව සඳහා,

01.ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා

02.ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

06. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා

07. ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.සමරසේකර මැතිතුමිය

08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා යන සභිකයන් පත් කිරීමටත්,

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 39 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව සභාව විසින් හෝ මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයන් සමඟ ඇතිකර ගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම් වන විට හා ගිවිසුම්ගත ඇස්තමේන්තු වටිනාකම රුපියල් දසදහසට (රු.10,000.00) වැඩි වූත් රුපියල් ලක්ෂ දහය (රු.1,000,000.00) නොඉක්මවන පරිදිත් වන මූල්‍ය වටිනාකමක් වෙනුවෙන් ගිවිසුම්ගත වීම සඳහා බලය දීම හා ඊට අදාළ ගිවිසුම් අනුමත කිරීම සඳහා වන බලතල ඉහත කී පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පැවරීමටත්,

**ඉහත කී උපලේඛනය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදමක් වන විටදී රුපියල් දස දහසේ සිට (රු.10,000.00) සිට රුපියල් ලක්ෂ දහය (රු.

1,000,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් දස දහසේ (රු.10,000.00) සිට රුපියල් ලක්ෂ දහය (රු.1,000,000.00) දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, කර්මාන්ත කාරක සභාව, පුස්තකාල හා උපදේශන කාරක සභාව , පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව , සංවර්ධන උපදේශන කාරක සභාව යන කාරක සභා වලින් නිර්දේශ කරනු ලබන රුපියල් දස දහසේ (රු.10,000.00) සිට රුපියල් ලක්ෂ දහය (රු.1,000,000.00) දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 10,000.00 සිට රු. 1,000,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම, අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම, නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම වේ.

වන සංශෝධිත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් එකී සංශෝධිත යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:01:02 කර්මාන්ත කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, අදාළ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කාරක සභාවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, සංවර්ධන කටයුතු සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

1. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

9. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය යන නම් සඳහන් සභිකයන් 08 දෙනෙකුගෙන් යුත් කර්මාන්ත කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී ගරු සභාපතිතුමන් පැවසුයේ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදදින සභාවේ නොසිටින බැවින් එතුමියගේ නම යෝජනා කළ නොහැකි බවයි.

ඒ අනුව නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, අදාළ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කාරක සභාවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, සංවර්ධන කටයුතු සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,

1. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 08 දෙනා පත් කිරීමට වන සංශෝධිත වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:01:03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කාරක සභාවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා,

01. ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා

02. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා

06. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා

07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා

08. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

09. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 09 දෙනෙකුගෙන්ද ප්‍රජා නියෝජනයෙන්

01.වෛද්‍ය දිලානි මිය

02.ආචාර්ය සම්පත් වාහල මහතා

03.අමිල අධිකාරම් මහතා

04.වෛද්‍ය සුජිත් ප්‍රියන්ත මහතා

05.මිලින්ද ලක්රුවන් මහතා

06.මොහොමඩ් සාදික් මහතා

07.ඩිලාන් ද සිල්වා මහතා

08.ඉෂාන් මොහොමඩ් මහතා

09.ෆවාස් මුසම්මිල් මහතා යන පුරවැසියන් 09 දෙනෙකුගෙන්ද යුත් පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:01:04 පුස්තකාල උපදේශන කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබා දීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කාරක සභාවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම, පුස්තකාල සාමාජික ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි

ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,

01.ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා

02.ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා

06. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

07. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා

08. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

09. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය යන නම් සඳහන් සභිකයන් 09 දෙනෙකුගෙන්ද ප්‍රජා සහභාගීත්වයෙන්,

01.දයාවංශ මහතා

02.දයානන්ද බිනරගම මහතා

03.නීතිඥ ශාන්තිලේඛා මිය

04.අරුන්දතී සූරියපටබැඳි මිය

05.අනුලා කහංගම මිය

06.නිලූකා මිය

07.සිරිවර්ධන මහතා

08.පාඨක සමාජයේ ලේකම් රේණුකා මිය යන පුරවැසියන් 08 දෙනෙකුගෙන්ද යුත් පුස්තකාල උපදේශන කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී ගරු සභාපතිතුමන් පැවසුයේ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදදින සභාවේ නොසිටින බැවින් එතුමියගේ නම යෝජනා කළ නොහැකි බවයි. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කලේ තමන් පුස්තකාල උපදේශන

කමිටුවෙන් ඉල්ලා අස්වන බවත්, නම් ඉදිරිපත් වුවද සමහර මන්ත්‍රීවරුන් කමිටු පැවැත්වීම සඳහා නොපැමිණෙන බැවින් සභාවේ මන්ත්‍රීවරුන් 16 දෙනාම කමිටු වලට පත්කර අපහසුතා තිබෙන අය කමිටුවලින් ඉල්ලා අස්වීම සුදුසු බවත් යෝජනා කරන ලදී.ගරු සභාපතිතුමන්ද පැවසුයේ කමිටු සඳහා තේරී පත් වී නොපැමිණ සිටීමෙන් කමිටුවේ සණ පූර්ණය නොමැති වීමෙන් අපහසුතා වලට මුහුණදීමට සිදුවන බවයි.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ඉහත ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් කළ යෝජනාව ස්ථිර කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ සභාවේ කාරක සභා පත්කරන්නේ සභාවේ පවතින සංකීර්ණත්වය අඩුකර සභාවේ කටයුතු පහසුවීමට බවත්, සභාවේ සියළු මන්ත්‍රිවරුන් කමිටු සඳහා සහභාගී වන්නේ නම් එවිට එය මහ සභාවම බවට පත්වන බවත් එවිට කාරක සභා පත් කිරීමේ අවශ්‍යතාවයක් නොවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් සබරගමුව විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති නෙයිසූරී මහත්මිය පුස්තකාල උපදේශන කමිටුවේ ප්‍රජා සහභාගීත්වය වෙනුවෙන් පත්කිරීමට යෝජනා කරන ලදුව නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ගරු සභාපතිතුමා පැවසුයේ ප්‍රජා සහභාගීත්වය වෙනුවෙන් සාමාජිකයන් පත් කර ඇති බැවින් නෙයිසූරී මහත්මිය අවශ්‍ය අවස්ථාවල පුස්තකාල උපදේශන කාරක සභාව වෙත සම්බන්ධ කර ගැනීම සුදුසු බවයි.

ඒ අනුව බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබා දීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කාරක සභාවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම, පුස්තකාල සාමාජික ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,

01.ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා

02.ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා

06. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

07. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 07 දෙනෙකුගෙන්ද ප්‍රජා සහභාගීත්වයෙන්,

01.දයාවංශ මහතා

02.දයානන්ද බිනරගම මහතා

03.නීතිඥ ශාන්තිලේඛා මිය

04.අරුන්දතී සූරියපටබැඳි මිය

05.අනුලා කහංගම මිය

06.නිලූකා මිය

07.සිරිවර්ධන මහතා

08.පාඨක සමාජයේ ලේකම් රේණුකා මිය යන පුරවැසියන් 08 දෙනෙකුගෙන්ද යුත් පුස්තකාල උපදේශන කාරක සභාව පත් කිරීමට වන සංශෝධිත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:01:05 සංවර්ධන උපදේශන කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා, ගරු සභාවේ සියළු සභිකයන් සහ ප්‍රජා සහභාගීත්වයෙන්,

1. මහාචාර්ය මනෝජ් ආරියරත්න මහතා
2. සේනක ගුරුසිංහ මහතා
3. අසංක බුවනෙක මහතා
4. ක්‍රීඩා උපදේශක රෝහණ මහතා
5. රවින්ද්‍ර කුමාර මහතා
6. විශ්‍රාමික පොලිසි පරීක්ෂක ඩබ්.වී ධර්මරත්න මහතා
7. වෛද්‍ය තුෂාර ෆොන්සේකා මහතා
8. ලාල් ගලප්පත්ති මහතා
9. ලක්ප්‍රිය ගුණරත්න මහතා

10. ඉඹුල්පේ දේවානන්ද හිමි
11. රෂාඩ් මවුලවි තුමන්
12. හින්දු කෝවිලේ තිරුමුගල් පූජකතුමන්
13. සමන් කුමාර මහතා
14. විමල් බණ්ඩාර මහතා
15. විශ්‍රාමික විදුහල්පති යසරත්න මහතා පුරවැසියන් 15 දෙනෙකුගෙන්ද යුත් සංවර්ධන උපදේශන කාරක සභාව පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** 2026 වර්ෂයේ පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාල වාර්ෂික සැලසුම් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
- ප්‍රසම්පාදන සැලැස්ම
- මාර්ග නඩත්තු සැලැස්ම
- වටරවුම් නඩත්තු සැලැස්ම
- වැසිජල කාණු නඩත්තු සැලැස්ම
- ස්ථාවර වත්කම් නඩත්තු සැලැස්ම
- අභ්‍යන්තර විගණන සැලැස්ම
- ආයතනයේ ගෙවීම් සම්බන්ධ මු.රෙ. 83 යටතේ නිලධාරීන්ට බලතල පැවරීම
- 2026 වාර්ෂික පුහුණු සැලැස්ම
- 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් ඉහත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.75,000 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සිදුකරන වැඩසටහන් වර්ෂයේ අවසන් මස සිදුකිරීම දක්වා ඇති බවත්,එය වර්ෂය අවසානය තෙක් ප්‍රමාද කිරීම සාධාරණ නොවන බවත්ය.ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත ක්‍රියාකාරී සැලැස්ම මඟින් දක්වා ඇති වැඩසටහන් අවශ්‍යතාවය අනුව ක්‍රියාත්මක කිරීමේ පිළිවෙළ වෙනස් විය හැකි බවයි.

නැවතත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ආයතනයේ ගෙවීම් සම්බන්ධ මු.රෙ. 83 යටතේ නිලධාරීන්ට බලතල පැවරීම යන්න පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙසයි.මේ පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ

යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.ලේකම්තුමියගෙන් අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:03** රටේ පැවති අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් 2025.11.30 ඉරිදා සතිපොළ සඳහා පැමිනි තොග සහ සිල්ලර වෙළඳුන් ප්‍රමාණය අඩුවීම හේතුවෙන් සතිපොළ ගාස්තු නිදහස් කර දෙන ලෙස පොළ ටෙන්ඩර්කරු වන සුජීව කුමාර මහතා යොමුකර ඇති ඉල්ලීම පිළිබඳව තීරණය කිරීම.(මෙදින සතිපොළ අධීක්ෂණයේදී වෙළඳ කුටි 130ක් පමණ වෙළඳාම් කිරීමේ සිදුවූ බව ආදායම් පරීක්ෂක වාර්තා කර ඇත.)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තොග පොළෙන් අයකරන මුදල් නොමැතිව පොළ කුටි 13කින් පමණක් රු.45,500ක පමණ මුදලක් ලැබෙන බවත්,ටෙන්ඩර්කරුගේ ආදායම වැඩි වූ අවස්ථාවල සභාවට වැඩිපුර මුදලක් නොගෙවන බවත්, ආදායම අඩු වූ අවස්ථාවල ගාස්තු නිදහස් කිරීමට ඉල්ලීම් කරන බවත්, ඒ අනුව මෙම ගාස්තු නිදහස් කිරීම ප්‍රතික්ෂේප කරන බවයි.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙම වර්ෂයේ සිට පොළ පවත්වාගෙන යනු ලබන්නේ සභාව මඟින් බවත්, ටෙන්ඩර් ලබා දිමට වඩා එහි ආදායමේ ප්‍රගතියක් පවතින බවත්ය.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.**

**07:01:04** 2025.12.08 දිනැතිව ගල්රෝල ලබාගැනීම වෙනුවෙන් ගෙවූ මුදල් වන රු.6000 මුදල සේවාව ලබා නොගැනීම මත ආපසු ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:05** තානායම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට අදාළ රු.400,574.06 ක පරිපාලන වියදම් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) කාර්යාලය වෙත ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:06** පශුවෛද්‍ය කාර්යාලයේ මුරකුටිය අළුත්වැඩියා කිරීම අවසන් බිල්පත රු.1,932,446.33 ක් ගෙවීම් කිරීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:07** බළන්ගොඩ තානායම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම වෙනුවෙන් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදල් සඳහා ,2026 ජනවාරි මස සිට දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් ඉදිරිපත් කරන ලද ණය ක්‍රමක්ෂය ලේඛණය අනුව ණය වාරිකය සහ පොලිය මාසිකව ස්ථාවර නියෝග මඟින් 2032 දෙසැම්බර් මාසය දක්වා මාසික වාරිකය රු.158,874.60ක් ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:08** පහත නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | නඩත්තු කටයුත්ත | ඇස්තමේන්තුගත මුදල |
|---|---|---|
| 01 | රිෂානා පේමිස් මාවත නඩත්තු කිරීම. | රු.584,000.00 |
| 02 | සුනන්දාරාම මාවත දෙවන අදියර සංවර්ධනය කිරීම. | රු.486,000.00 |
| 03 | කරව්කැටිය කොටුගොඩැල්ල 7වන පටුමඟ බෝක්කුව ඉදිකිරීම. | රු.316,000.00 |

| | | |
|---|---|---|
| 04 | රබර්වත්ත පාර සංවර්ධනය කිරීම. | රු.440,000.00 |
| 05 | කෝපිවත්ත පාර සංවර්ධනය කිරීම. | රු.350,000.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් මෙම යෝජනා මන්ත්‍රීතුමන්ලා ලබාදුන් යෝජනාද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ කලින් මන්ත්‍රීතුමන්ලා විසින් ලබාදුන් යෝජනා අනුව එකී නඩත්තු තෝරාගෙන ඇති බවයි.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ෆලීල් හාජියාර් මාවත නඩත්තු කිරීම පිළිබඳව විමසීම් කරන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ එකී මාර්ගය අළුත්වැඩියා කිරීම සම්බන්ධව මතුව ඇති ගැටළුව වන්නේ මේ වන විට ගල්රෝල අළුත්වැඩියා කටයුතු සඳහා යොදවා තිබීම බවත් එකී අළුත්වැඩියා කටයුතු අවසන් වූ වහාම ෆලීල් හාජියාර් මාවතේ අළුත්වැඩියා කටයුතු ආරම්භ කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉහත කර්මාන්ත පහ සඳහා අනුමැතිය ලබා ගැනීමේ විශේෂ හේතුව කුමක්ද යන්න ගැටළුවක් බවයි.පසුගිය ආපදා තත්වය ඇති අවස්ථාවේ සිදු කළ වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමා,ලේකම්තුමිය,වැඩ අධිකාරිතුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයම උදව් කළ බවත්, ඒ වෙනුවෙන් ස්තූතිය පුද කරන බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.එමෙන්ම වැඩිදුරටත් අදහස් දක්වමින් එතුමා සඳහන් කලේ එම අවස්ථාවේදී චෙක්රෝලේ මාර්ක් කිරීමේදී අංශප්‍රධානීන් පැමිණීම පිළිබඳ තහවුරුව ලබා දෙන්නේ නම් ඕනෑම දෙයක් කළ හැකි බවත්, සභාවේ අවුරුදු 10-12 වැඩකරන කම්කරුවන්ට දෛනික වැටුප් රු.1900ක් ලබාදෙන බවත්, දිස්ත්‍රික් මිල ගණන් අනුව වෙනත් කම්කරුවන්ට රු.2400ක් ගෙවිය හැකි බවත්, එහිදී එම අඩුවෙන් ගෙවීම හේතුවෙන් එම කම්කරුවන්ගේ කාර්යක්ෂමතාවයද හීන වී ඇති බවත්, වැඩ සුපරීක්ෂකවරුන් සිටියද විධිමත් ලෙස එම කාර්යය සිදු නොවන බවත්, සමහර අයවලුන් අතිකාල නොමැති බව පවසා චෙක්රෝලට නම දාලා දෙන්න කියන බවත් මේවා නිසි අධීක්ෂණයකින් සිදු නොවීම මත අවසානයේ මුදල් ගැටළු ඇතිවන බවත්, සිදුකළ ව්‍යාපෘති අනුව වැඩ සිදුවන ආකාරය දන්නා බවත් එබැවින් දෛනික වැටුප් සඳහා ගෙවීම් කරන්නේ නම් සේවකයන් අදාළ ස්ථානයේ සිදු කරන ලද කාර්යය සහ රැඳී සිටි බවට වන නිර්දේශය අනිවාර්යෙන්ම ලබා ගත යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ ඉහත දක්වන ලද මන්ත්‍රීතුමාගේ කතාව නිවරදි බවත්, වැඩ පරිපාලකවරයෙකු සිටිනම් අනිවාර්යෙන් අධීක්ෂණයක් සිදු විය යුතු බවත්, උදාහරණයක් ලෙස ඇවිදින මංතීරුවේ කොන්ක්‍රිට් කිරීමට සේවකයන් 05 දෙනා බැගින් දින 04ක් යොදවා ඇති බවත්, එවිට මිනිස් දින 20ක ප්‍රමාණයක් ඒ සඳහා භාවිතා කර ඇති බවත්, එම ඇවිදින මංතීරුවේ ඇවිදින ජනතාව මේවා දකින බවත්, වැඩ පරිපාලකවරුන් සිටිනම් නිසි අධීක්ෂණයක්

සිදුවිය යුතු බවත්, පසුගිය ආපදා සමයේ සිදුකළ හදිසි ව්‍යාපෘති සිදුකිරීමේදී සිදු කරන නියම ක්‍රමවේදය දුටු බවත්ය.

තවත් කරුණු දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ සභාවේ සමහර සෞඛ්‍ය කම්කරුවන් සුපරීක්ෂක රාජකාරී කරන බවත්,නමුත් ඔවුනට සෙනසුරාදා දින අත්‍යවශ්‍ය රාජකාරියකට කතා කළ විට අතිකාල නොමැති බැවින් පැමිණිය නොහැකි බව දන්වන බවත්ය.

ඉහත ව්‍යාපෘති සඳහා මුදල් සභාව සතුව පවතිනවාද යන්න ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විමසන ලද අතර එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ සභාව සතු යන්ත්‍ර සූත්‍ර හා සීමිත කම්කරුවන් ප්‍රමාණය හේතුවෙන් මෙම ව්‍යාපෘති සභාව මඟින් සිදු කිරීම නැවැත්විය යුතු බවත්, එසේ සභාව මඟින් සෘජුව ව්‍යාපෘති සිදු කිරීම ගැටළුවක් වී ඇති බවත්, මුදල් පවතීනම් මෙවැනි ව්‍යාපෘති කොන්ත්‍රාත් ලබා දීම සුදුසු බවත්, ඒවායින් ලාභය ඇත්තේ 17%-18%ක් පමණ බවත්, එසේ නොමැතිනම් අධීක්ෂණ නිලධාරීන් ප්‍රමාණවත් නොවීම මත නිසි පරිදි එම කාර්යය සිදු නොවන බවත්ය.

පසුගිය ආපදා තත්වය හේතුවෙන් සිදුකළ ව්‍යාපෘති සිදු කිරීමේදී, සමහර සේවකයන් තමන් සිටින තනතුරේ නොමැතිව වෙනත් තනතුරුවල වැඩ බැලීම් සිදු කළද දුරකථන ඇමතුම් වලටවත් ප්‍රතිචාර නොදැක්වූ බවත්, එම අවස්ථාවේ ලාල් ප්‍රේමසිරි රියදුරු මහතා වැටුපවත් නොගෙන එම දිනවල රාජකාරියට පැමිණි බවත්, අවම වශයෙන් එම තනතුරුවල රාජකාරී කරන සේවකයන්ට තමන් කරන රාජකාරිය පිළිබඳ අවබෝධයක් තිබිය යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ කුඩා කැපවීමක්වත් ආයතනය වෙනුවෙන් කිරීමට නොහැකි සුළු සේවකයන් සිටින බවත්, සියල්ලෝම එසේ නොවන බවත් ගරු සභාපතිතුමා පැවසූ අතර සභාවේ මන්ත්‍රීතුමන්ලා, කාර්යමණ්ඩලය ඇතුළු සියළු දෙනා මීට වඩා අවබෝධයකින් වැඩ කටයුතු කළ යුතු බවත්, එම සියළුම දෙනාගේ සහයෝගය නොමැතිව මෙය සිදුකළ නොහැකි බවත්, විශේෂයෙන් සභාවේ සේවකයන් යොදවා කර්මාන්ත කටයුතු සිදු කිරීමේදී අධීක්ෂණය භාර නිලධාරින් ඒ සම්බන්ධව විධිමත් අධීක්ෂණයක් සිදු කරන ලෙසත් වැඩිදුරටත් පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ව්‍යාපෘති සිදු කිරීමේදී විෂය නිලධාරිනියන් පැමිණ එම කාර්යය විධිමත්ව අධීක්ෂණය සිදු කිරීමක් පසුගිය ආපදා හේතුවෙන් සිදුකළ ව්‍යාපෘති සිදු කිරීමේදී දුටු බවත්, ඒ අනුව විෂය නිලධාරියා වැඩ ක්ෂේත්‍රයට ගොස් සුපරීක්ෂක මඟින් අදාළ සේවකයා රැඳී සිටීම පිළිබඳ තහවුරුව ලබාගෙන මුදල් ගෙවා එම කාර්යය විධිමත් ලෙස සිදුවන බවත් එබැවින් එලෙස විෂය නිලධාරියා යොදවා ක්ෂේත්‍රයේ රාජකාරී අධීක්ෂණය සිදු කර ගෙවීම් කිරීමට යෝජනා කරන බවත්ය.

ඉහත කර්මාන්ත වලට අදාළ ඇස්තමේන්තුවලට අදාළව කර්මාන්ත සිදු කිරීමට අමුද්‍රව්‍ය සභාවෙන් සපයා බාහිර ශ්‍රමය මිලදී ගැනීම් පමණක්ද යන්න ගරු නාගරික මන්ත්‍රී විමසන ලදුව සභාවේ ඇස්තමේන්තු සම්බන්ධව කෑ කෝ ගැසීමක් ඇති විය.

අනතුරුව ඇස්තමේන්තු සම්බන්ධව විමසීම් කිරීම වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු උප සභාපතිතුමන් විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අදාළ කරුණු සාකච්ඡා කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත නඩත්තු කටයුතු ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු යටතේ ඉටු කිරීමේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:09** වරිපනම් තක්සේරු ලේඛනවල සඳහවලට අදාළ දේපල පරීක්ෂා කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් වාර්තා කර ඇති තොරතුරු පදනම් කරගනිමින් වාර්තාවක් පිළියෙළ කර ඇත.එම වාර්තාව අනුව තක්සේරු ලේඛනයේ සඳහන් වුවද භෞතිකව දේපල නොමැති හා තක්සේරු ලේඛනයට ඇතුළත් කිරීමේදී ඇතිවී ඇති විවිධ ගැටළු නිසා හිඟ මුදල් දිගින් දිගටම ලේඛනගත වෙමින් පවතී.එබැවින් හිඟ මුදල් ලෙස සටහන් වී ඇති මුදල දේපළ තක්සේරු ලේඛනයෙන් ඉවත්කිරීම සුදුසු හෙයින් තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉහත කාරණාව පිළිබඳ ආදායම් අංශ ප්‍රධානී මහතාගෙන් කරුණු පැහැදිලි කිරීමක් වෙනුවෙන් ගරු සභාපතිතුමන්ගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

**ප.ව.12.12ට පමණ ගරු සභාපතිතුමා විසින් මූලාසනය උප සභාපතිතුමා වෙත භාරදෙන ලදී.**

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු උපසභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:10** 2025-12-01 සිට 2025-12-31 දින දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ ටෙන්ඩර්කරු වෙත රු.1,250,000ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ප.ව 12.14ට පමණ ගරු උප සභාපතිතුමා නැවත මූලාසනය ගරු සභාපතිතුමා වෙත භාර දෙන ලදී.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කසළ ටෙන්ඩරය ලබාගෙන ඇති ටෙන්ඩර්කරු පසුගිය කාලයේ එම කසළ ඉවත් කිරීමේ ටෙන්ඩරයට අදාළ කටයුතු නිසි පරිදි සිදු කළ බවත්, පසුව මෙම වර්ෂයේ සිට ටෙන්ඩරය භාරදීමේදී සභාවෙන් ටෙන්ඩරයට අදාළ වැඩ කොටස වැඩිකළ බවත්, එබැවින් සමහරක් දේවල් දැන් මඟහැරී ඇති බව දක්නට ඇති බවත්, එම ටෙන්ඩරය ලබාගත් මහත්මියගෙන් එම අතිරේකව පැවරූ වැඩ කොටස සාකච්ඡා කර ඉවත් කලානම් පෙර පරිදිම එම මහත්මිය නිසි ක්‍රමවේදයකින් පවත්වා ගෙන යනු ඇති බවත්, එම අඩුපාඩු වලට හේතුව සභාවෙන් වැඩි වැඩ කොටසක් පැවරීම විය හැකි බවත්ය.

ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා පැවසූයේ ඉහත ගරු මන්ත්‍රීතුමා පැවසූ කතාව ඇත්ත බවත්, එහිදී යෙදවිය යුතු අවම සේවක ප්‍රමාණය යෙදවීමක් සිදු නොවන්නේ නම් එම කාර්යය සම්පූර්ණව සිදු නොවීමේ හැකියාවක් පවතින බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ සමහරු අඩුපාඩුවක් දුටු සැණින් සමාජ මාධ්‍යයට මුදාහැරීම සිදුකරනු ලබන බවත්, එසේ සිදු නොකර අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ගැටළු විසඳා ගන්නේ නම් එය වැදගත් බවත්, කසළ ටෙන්ඩරය ලබා ගත් මහත්මිය එය නිසිආකාරයෙන් සිදු කිරීමට බොහෝ වෙහෙසක් ගන්නා බවත්, අඩුපාඩු පැවතිය හැකි බවත්, එම අඩුපාඩු ටෙන්ඩර්කරු දැනුවත් කර නිවරදි කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් එය සභාව සහ ටෙන්ඩර්කරු යන දෙපාර්ශවටම වැදගත් වනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ කසළ එකතු කිරීමේදී පැම්පස් ආදිය එකතු නොකරන බැවින් මාර්ගවල තැනින් තැන එම පැම්පස් ආදිය දමන බවත්, එමෙන්ම කාන්තා සනීපාරක්ෂක තුවා බැහැරකිරීම සම්බන්ධවද ගැටළුවක් පවතින බවත්, ඒ සඳහා පිළියමක් අනිවාර්යෙන් යෙදිය යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ පෞද්ගලික ආයතනයක් ඉහත අපද්‍රව්‍ය එකතු කිරීම සම්බන්ධව අදදින ලිපියක් ඉදිරිපත් කර ඇති බවයි.ඒ අනුව එම ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත ලිපිය ඉදිරිපත් කර ඇති ආයතනය වෙත ලිපියේ ඉදිරිපත් කර ඇති කරුණු පිළිබඳව ජනතාව දැනුවත් කර එම කසළ ට්‍රැක්ටර් රථවලට ලබා නොගන්නා අපද්‍රව්‍ය ලබාදීමට පවත්නා හැකියාව පිළිබඳ ජනතාව දැනුවත් කළ යුතු බවයි.එවිට සභාවට පවත්නා ගැටළුවට විසඳුමක් ලැබෙන බවත්, කසළ එකතු කිරීමේදී ට්‍රැක්ටර් රථ වලට මෙම අපද්‍රව්‍ය අනෙකුත් කසළ සමඟ ලබාදීමේදී බැංකියවත්ත කසළ අංගනයේ කසළ තේරීම් කටයුතු සිදු කරනු ලබන සේවකයන් අපහසුතාවයට පත්වන බවත් මේ සම්බන්ධව අවස්ථා ගණනාවකදී මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා

සමඟ ගොස් විවිධ ස්ථාන සඳහා දැනුවත් කිරීම් සිදු කළ බවත් ඉහත ආයතනය පිළිබඳ දැනුවත් කර එම වැඩපිළිවෙළ අනුගමනය කිරීම සුදුසු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ කසළ ටෙන්ඩර්කරු වෙනත් මින් පෙර ටෙන්ඩරය  ලබා ගත්  ටෙන්ඩර්කරුවන්ට වඩා ඉතා සාර්ථකව එම කාර්යය ඉටුකරන බවත්, එතුමිය වෙත වෙනත් පළාත් පාලන ආයතන වෙතින්ද ඉල්ලීම් පැමිණ ඇති බවත්, මෙහි එම ටෙන්ඩර්කරු එය සාර්ථකව කරනවාට කැමති නැති පිරිසක්ද සිටින බවත්, නමුත් සභාවේ අවම වශයෙන් කසළ ටෙන්ඩර් ගිවිසුමවත් නොතිබුන බවත්, ටෙන්ඩර්කරුට කතා කර ගිවිසුම ඡායා පිටපත් ලබාගත් බවත්, එතුමිය මෙම ටෙන්ඩරය ලබා ගන්නා දිනයේද මෙහි ඇති බරපතලකම පිළිබඳව පැහැදිලි කළ බවත්, එම සේවකයන් සොයාගෙන ඇත්තේද ලංකාවේ විවිධ ප්‍රදේශවලින් බවත්, මෙම කසළ ටෙන්ඩරය විධිමත්ව සිදුකිරීම පහසුකාර්යයක් නොවන බවත්, නමුත් මෙම ටෙන්ඩරය ලබාගත් මහත්මිය සභාවෙන් ලබාගත් සෑම ටෙන්ඩරයක්ම නිසි පරිදි සිදු කළ බවත්, නිලධාරින්ට අවංකව සභාපතිවරයාට නම්‍යශීලීව එම කාර්යය සිදු කරන බවත්, බළන්ගොඩ නගර සභාව කසළ කළමණාකරණය සම්බන්ධයෙන් අද පළමු තැනක සිටින්නේද එම ටෙන්ඩර්කරුවන්ගේද නිසි කැපවීම මත බවත්,තමන් විසි වතාවකට වඩා එම අවස්ථාවලින් විදේශ ගතවී ඇති බවත්, එබැවින් මෙය කාගේ හෝ දේශපාලන උවමනාවන් මත  කඩාකප්පල් කිරීමට ඉඩ නොදිය යුතු බවත්, ඒ වෙනුවට එම කාර්යය දිරිමත් කිරීමේ වැඩපිළිවෙළකට යාම සුදුස බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමමා පැවසුයේ එතුමියගේ වැරද්දක් නොකියූ බවත්, එතුමියට සභාව මඟින් අමතර වැඩ කොටසක් පැවරූ බැවින් එම වැඩ කොටස ඉවත් කිරීම සම්බන්ධව කතා කළ බවත්ය. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ සෞඛ්‍ය කමිටුවේදීද ගිවිසුම සම්බන්ධව ගැටළුවක් මතු වූ බවත්, එම ගිවිසුම එම අවස්ථාවේ නොතිබූ බවත්ය.

කසළ ටෙන්ඩරයේ ගිවිසුම පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගෙන් කරුණු විමසීම් කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව අදාළ කරුණු විමසීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ප.ව.12.45ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**07:01:11** 2025 නොවැම්බර් මස දෛනික වැටුප් රු.1,696,655.35 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ තමන් සභා වාර ගණනාවකදීම මෙම දෛනික වැටුප් ගෙවීම සම්බන්ධව අධිභාරයක් වන බවට පුන පුනා අදහස් දැක්වූ බවත්, ඒ අනුව තමන් ඉහත යෝජනාවට මෙන්ම න්‍යාය පත්‍රයේ 07:01:12 යෝජනාවටද විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්ය.ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමියද තම විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදි. මේ සම්බන්ධව බෙදීමක් ඉල්ලා සිටින බවත්, මේ සම්බන්ධව ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කරගැනීම වෙනුවෙන් කාරක සභාවක් ලබා දෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා යෝජනා කරන ලදී.ඒ අනුව අදාළ කරුණු පැහැදිලි කරගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

දෛනික වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පැවති කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා ඉහත 07:01:11 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් විවෘත ඡන්ද විමසීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට දැනුම් දෙන ලදී.

ඉහත 07:01:11 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
02. ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් වන්දන මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 06 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා

02. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය

06. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා ලෙස ගරු සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කළ අතර මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදදින සභාවට නොපැමිණි සභිකයා වන අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා මෙම අවස්ථාව වන විට සභාවෙන් පිටව සිටි සභිකයා වේ. ඒ අනුව 07:01:11 යෝජනාව වැඩි ඡන්ද 02කින් සභා සම්මත විය.

**07:01:12** 2026 ජනවාරි මස සිට 2026 දෙසැම්බර් මස දක්වා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව දෛනික වැටුප් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහාද බෙදීමක් යෝජනා කළ බැවින් ගරු සභාපතිතුමා ඉහත යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් විවෘත ඡන්ද විමසීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට දැනුම් දෙන ලදී.

ඒ අනුව ඉහත යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා

02. ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා

06. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා

07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා

08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 06 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා

02. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

05. ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය

06. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා ලෙස ගරු සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කළ අතර මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදදින සභාවට නොපැමිණි සභිකයා වන අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා මෙම අවස්ථාව වන විට සභාවෙන් පිටව සිටි සභිකයා වේ. ඒ අනුව 07:01:12 යෝජනාව වැඩි ඡන්ද 02කින් සභා සම්මත විය.

**07:01:13** අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීම.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත යෝජනාව ඉදිරිපත් කළද අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව මෙතෙක් ලැබී නොමැති බැවින් ඉදිරි සභා වාරයක් වෙත ඉදිරිපත් කරන බවයි.

**07:01:14** පී.එම්.ජී.ඒ.බණ්ඩාර මයා විසින් 2025.11.17 දින ඉදිරිපත් කර ඇති මහජන පැමිණිල්ලට අනුව වැසි දිනවල 7 වන පටුමග කොටුගොඩැල්ල පාරේ ජලය තම මිදුලට සහ නිවස තුලට පැමිණීම පිළිබඳව අප වෙත දන්වා ඇත.

එම කරුණ සම්බන්ධයෙන් අප ආයතනයේ කාර්මික නිලධාරී මහතා විසින් පරික්ෂා කිරීමෙන් අනතුරුව එම ගැටළුවට පිළියමක් ලෙස කරවුකැටිය කොටුගොඩැල්ල මාර්ගයේ විශ්කම්භය 450 cm ප්‍රමාණයේ හියුම් පයිප්ප බෝක්කුවක් යොදා ඇති බවත් එම බෝක්කුවට කරව්කැටිය,උඩකන්ද ප්‍රදේශ වලින් ගලා එන වැසි ජලයද කරවුකැටිය ඉහල ඉඩම්වල වැසි ජලයද ගලා එන අතර එම ගලා එන වැසි ජලය බැස යාම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ජලය බැසයාමට ප්‍රමාණවත් විවරයක් සහිත 600x 1000mm ප්‍රමාණවත් U හැඩැති පෙට්ටි බෝක්කුවක් යෙදිය යුතු බවත් නිර්දේශ කර ඇත.

ඒ අනුව එම බෝක්කුව යෙදීම සඳහා කරවුකැටිය කොටුගොඩැල්ල කාපට් ඇතිරූ මාර්ගය පලුදු කිරීමට සිදුවේ. නමුත් 2024.11.29 ගැසට් නිවේදනය අනුව මාර්ගය පලුදු කිරීමට නොහැකි බැවින් මාර්ගය පලුදු කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති ජේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව වැඩ අධිකාරී මහතාගෙන් කරුණු විමසීම් කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:15** බළන්ගොඩ නගර සභාව සතු නව බස්නැවතුම්පොල අංක සී 45 දරණ කඩ කාමරය 2013 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වාර්ෂික බදු ගිවිසුම් අත්සන් කර කඩ කුලිය ගෙවනු ලැබුයේ මොහොමඩ් මන්සූර් මහතා විසිනි. එම මහතා 2025.03.09 වන දින මියගොස් ඇති බව 2025.12.24 දිනැති ලිපිය මගින් දන්වා ඇත.
ඔහුගේ පුත්‍රයෙකු විසින් මෙම කඩ කාමරය සඳහා වාර්ෂික ගිවිසුම් අත්සන් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලමින් ලිපියක් ඉදිරිපත් කර ඇත.ඒ සඳහා මවගේ සහ සහෝදරයාගේ අකමැත්තක් නොමැති බව දන්වමින් ලිපි ඉදිරිපත් කර ඇත. මෙම කඩ කාමරය බදු දුන් දින සිටම වාර්ෂිකව ගිවිසුම්ගත වී ඇති කඩ කාමර වේ.

2023.08.09 දින නිකුත් කරන ලද ප.පා.කො. 1/2023 චක්‍රලේඛයට අනුව, බදු පදනම මත කඩ කාමර ලබා දීමේදී එහි වගන්ති 8.9 යටතේ ඇති (ඇ) උප වගන්තිය යටතේ ගිවිසුම් බදු කාලසීමාව තුළ බදුකරු මියයන අවස්ථාවකදී ඉතිරි බදු කාල සීමාව සඳහා පමණක් උරුමය පිළිගනු ලබන ආකාරය දක්වා ඇත.

ඒ අනුව, බදු කාල සීමාව අවසානයේ ඔහුගේ පුත්‍රයා විසින් ඔහුගේ නමින් බදු අයිතිය ඉල්ලා සිටින බැවින්ද ඉහත චක්‍රලේඛ ප්‍රකාරව එය සිදු කල නොහැකි බැවින්ද ඒ පිළිබඳ තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් මෙම අවස්ථාවේ පළාත් පාලන ආයතන සතු වෙළඳපල,සතිපොළ, දිනපතා පොළ,කඩ කාමර, විවිධ කඩ කාමර බදුදීම හෝ කුලියට දීම යන මැයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG-5/3/1 අංක හා 2026.01.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමන් පැවසූයේ 07:01:15 යෝජනාවේ සඳහන් කාරණාව සඳහා ඉහත ලිපියේ සඳහන් උපදෙස් ප්‍රකාරව කටයුතු කළ නොහැකි බැවින් ඉහත කඩ කාමරය සම්බන්ධව උපදෙස් ලබා ගැනීම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු සභාවේ විරෝධතා නොවූ හෙයින් ඒකමතිකව සම්මත විය.

**07:01:16** බළන්ගොඩ නගර සභාව වෙත ප්ලේට් කම්පැක්ටරයක් ලබා ගැනීමට පිරිවිතරයන් සකස් කිරීම සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය ලබා දී ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| **අනු අංකය** | **නිලධාරියාගේ නම හා තනතුර** | **ආයතනය** | **අදාළ කමිටුවේ සභාපති/සාමාජික** |
|---|---|---|---|
| 01 | කේ.එම්.එස්.සී වේරහැර මහතා-නියෝජ්‍ය අධ්‍යක්ෂ (පළාත් පාලන) | පළාත් පාලන දෙපාර්තමේන්තුව | සභාපති |
| 02 | කේ.ඩබ්.එම්.ටී.එස්.ආනන්ද මහතා - යාන්ත්‍රික ඉංජිනේරු | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)කාර්යාලය | සාමාජික |
| 03 | එස්.එන්.කේ.කේ.ආර් නාරායන මහතා-කාර්මික නිලධාරී | පළාත් පාලන දෙපාර්තමේන්තුව | සාමාජික |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.සමරසේකර මැතිතුමිය**

**07:02:01** වීථි ලාම්පු සවිකිරීම සම්බන්ධව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කලේ තමාගේ කොට්ඨාශයේ වීථි ලාම්පු සවිකිරීමේ කටයුතු මේ වන තෙක් සම්පූර්ණ කර නොමැති බවයි.ගරු සභාපතිතුමා සඳහන් කලේ විදුලි කාර්මික මහතා හදිසි අනතුරක් මත සේවයට නොපැමිණීම මත සහ සිටින විදුලි කාර්මික මහතාට තනිව එම කාර්යය සිදු කිරීමට නොහැකිවීම මත මඳක් එම කටයුතු ප්‍රමාද වී ඇති බවයි.ඒ අනුව මේ සම්බන්ධව වැඩිදුර කරුණු විදුලි කාර්මික මහතාගෙන් පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:02:02** වැලිහරනාව පාර තොසිල ගාර්ඩන් වෙත හැරෙන ස්ථානයේ උත්තල කණ්ණාඩියක් සවි කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.සමරසේකර මැතිතුමිය පැවසූයේ එම ස්ථානයේ අනතුරු අවම කිරීම සඳහා ඉහත යෝජනාව ඉදිරිපත් කළ බවයි.ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ මාර්ග සංවර්ධන අධිකාරියේ එකඟතාවය ලබාගෙන ඉහත යෝජනාව ක්‍රියාත්මක කළ හැකි බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:03** වැලිගරනාව මාර්ගයේ අල්මේදා මහත්මියගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:03:01** පසුගිය මසද ඉල්ලා සිටි නමුත් නොලැබුණු පසුගිය මාස කිහිපය තුළ සිදුකළ නඩත්තු කටයුතු (දෛනික වැටුප් ගෙවා සිදුකළ) සම්බන්ධ සවිස්තර වාර්තාව සභිකයන් වෙත ලැබීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ගරු සභාපතිතුමන් පැවසූයේ ඉහත යෝජනාවට අදාළව විස්තර මේ වන විට ලබා දී ඇති බවයි.

**07:03:02** අතිකාල ගෙවීම් සම්බන්ධව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ සමහර නිලධාරීන් ඉතාමත් වගකීමෙන් වැඩ කරන බවත්, නමුත් අත්‍යවශ්‍ය රාජකාරී සඳහා නිලධාරීන් ගෙන්වා ගැනීමේදී ඔවුන්ට අතිකාල ගෙවීමට කටයුතු කළයුතු බවත්, හිලව් නිවාඩු ලබා ගත්තද එම නිවාඩු ඕනැතරම් තිබෙන බවත්, එබැවින් සති අන්ත දිනවල අත්‍යවශ්‍යම රාජකාරීවලට වාර්තා කරන නිලධාරීන් වෙත අතිකාල ගෙවිය යුතු බවට යෝජනා කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:03** තවමත් ස්ථිර නොමැති සේවකයන්ගේ අධ්‍යාපන මට්ටම ලබා දීම සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:04** මුගුණමලය පොල්වත්ත පාර සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා**

**07:04:01** ඕලුගංතොට වළවේ ගං ඉවුරෙහි පාලම දෙපස Life Care රෝහල දක්වා කොටස නාගරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:02** ඕලුගංතොට සෙලෝවත්ත පාර පැතිබැම්ම ඉතිරි කොටස ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:03** කිරිදිගල සිට ඕලුගංතොට දක්වා මාර්ගය දෙපස වීථි පහන් සවිකර නොමැත, ඒ සම්බන්ධව ඇති ගැටලුව සොයාබලා එම විදුලි පහන් සවිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් පැවසුයේ ඉහත ස්ථානයේ විදුලි පහන් සවිකිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:04** ඕලුගංතොට මඩේවත්ත උඩපාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කළ මාර්ගයේ මීටර් 12 පමණ ඉතිරි කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**07:05:01** බළන්ගොඩ නගර සභා පොදු ක්‍රීඩාංගණයේ දැනට අක්‍රියව පවතින විදුලි බුබුළු (Flash Lights)අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය වෙත රාත්‍රියට පැමිණෙන පිරිස වැඩි බැවින් ඉහත යෝජනාව අත්‍යාවශයෙන් ක්‍රියාත්මක කළ යුතු බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කලේ පසුගිය දිනක ක්‍රීඩාංගණයේ පැවැති ක්‍රිකට් තරඟාවලියකදී නගර සභාව ඉතාමත් දෝෂාරෝපණයට ලක්වූ බවත් එබැවින් කඩිනමින් ඉහත යෝජනාව ක්‍රියාත්මක කළ යුතු බවත්,

තවදුරටත් එම ස්ථානය මේ තත්වයෙන් නොමැතිව ක්‍රීඩාංගණයේ ප්‍රේක්ෂකාගාරය ඇතුළුව සියළුම අළුත්වැඩියා සිදු කළ යුතු බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:02** නගර සභා පොදු ක්‍රීඩාංගණයේ තණකොළ කැපීම සඳහා අත්ට්‍රැක්ටරයක සවිකළ තණකොළ කපන යන්ත්‍රයක් මිලදී ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

**07:06:01** කිරිදිගල රයිලි මෝටර්ස් ඉදිරිපිට වංගුවේ කන්ද උඩ අනතුරුදායක ලුණුමිදෙල්ල ගස ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා පැවසුයේ ඉහත ස්ථානයේ දැඩි අනතුරුදායක තත්වයක් පවතින බැවින් කඩිනම් අවධානය යොමු කරන ලෙසයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:02** ඕලුගංතොට තෝරවත්ත පාර අසළ අශෝක මහතාගේ නිවෙසේ වහලට අනතුරුදායකව ඇති ගස්වල අතු කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**07:07:01** කරච්කැටිය, වැකුඹුර පාරේ කරච්කැටිය පන්සලට යන පාරේ අඩි 15ක් පමණ දිග ඇති පැති බැම්මේ කොටස කැඩී ගොස් ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ අනතුරුදායක ගස් ඉවත් කිරීම පිළිබඳව කතා කිරීමේදි සභාවෙන් සිදු නොවීම මත සුදර්ශනගම අනතුරුදායක ගසක් ඉවත් කිරීමට රු.23,000ක් තමාගේ පුද්ගලික මුදලින් වැය වූ බවයි.

**08. කාරක සභා වාර්තා සලකා බැලීම**

2025-12-03 සහ 2025-12-18 දින පැවති මුදල් කාරක සභා වාර්තාව මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර එකී වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

**2025 නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.18,335,879.62 |
| මූලධන ලැබීම් | රු.199,636.42 |
| වෙනත් ලැබීම් | රු.2,138,074.71 |
| මුළු ලැබීම් | රු.20,673,590.75 |
| පුනරාවර්තන වියදම් | රු.18,146,467.51 |
| ප්‍රාග්ධන වියදම් | රු.689,131.21 |
| වෙනත් වියදම් | රු.5,741,294.66 |
| මුළු වියදම් | රු.24,576,893.38 |

**2025 දෙසැම්බර් මස ඉන්ධන වාර්තාව**

| **2025 දෙසැම්බර් ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල |
| 226-7521 | 28810.77 |
| 227-5020 | 86746.54 |
| 37-7933 | 2770.00 |
| 56-1906 | 48475.00 |
| BC0005 | 66480.00 |

| | |
|---|---|
| DDR0008 | 24628.00 |
| DPP0006 | 41975.00 |
| GC0001 | 26490.00 |
| GK1483 | 30820.00 |
| GK6227 | 16620.00 |
| HF7899 | 107379.54 |
| HF8558 | 15498.00 |
| JD4684 | 4116.00 |
| LL7688 | 13850.00 |
| MM 8152 | 1470.00 |
| ND5124 | 31024.00 |
| PF4006 | 56231.00 |
| QL2901 | 5021.94 |
| RC 1107 | 8864.00 |
| RC1118 | 44772.00 |
| RC8183 | 43567.05 |
| RD8000 | 56792.67 |
| RD8240 | 90598.39 |
| UQ1933 | 2352.00 |
| VI1833 | 2940.00 |
| ZA9835 | 75417.00 |
| **Total** | **933708.90** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ කාර්ක් පාර්ක් කඩ කාමරය සම්බන්ධ ගැටළුවේදි තමන් සභාපතිතුමාට පවතින ලෙන්ගතුකම හේතුවෙන් එම කරුණු පැහැදිලි කළ බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ පසුගිය ආපදා තත්වය හමුවේ කිරිදිගල කොට්ඨාශයට දැක්වූ සහයෝගය ලබාදුන් සැමට ස්තුතිවන්ත වන බවයි.

## 11. අවසානය

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තූතිය පුද කරන බවත්, අදදින සභාපති ධූරයෙන් ඉල්ලා අස්වන බවත්, ඉදිරි සභා කටයුතු උප සභාපතිතුමාට භාරදෙන බවත්, මෙය තමන්ගේ පෞද්ගලික හේතුවක් මත ලබාගත් තීරණයක් බවත්, තමන් කුමාරගම වසමේ ජනතාව වෙනුවෙන් මන්ත්‍රී ධූරයේ තවදුරටත් රැඳී සිටින බවත් සඳහන් කරමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.1.50ට පමණ අවසන් කරන ලදි.

කේ.ජී.පේමදාස,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.